323 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 323 - இல. 12
Volume 323 - No. 12

2025 නොවැම්බර් 28වන සිකුරාදා
2025 நவம்பர் 28, வெள்ளிக்கிழமை
Friday, 28th November, 2025

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
2026 අය වැය කාරක සභා අවස්ථා විවාදයේ සංශෝධිත වැඩසටහන [තීරුව 2381]
වරප්‍රසාද: 2025.11.10 දින ගරු සුජීව සේනසිංහ මහතා විසින් කරන ලද ප්‍රකාශය [තීරුව 2382]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2383]

**රාජ්‍ය ණය කළමනාකරණ පනත:**
නියෝග [තීරුව 2393]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
2026 வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்திற்கான திருத்திய நிகழ்ச்சிநிரல் [ப: 2381]
சிறப்புரிமை: 10.11.2025 அன்று மாண்புமிகு சுஜீவ சேனசிங்ஹவால் தெரிவிக்கப்பட்ட கூற்று [ப: 2382]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 2383]

**பொதுத் தனிசு முகாமைத்துவச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 2393]

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Amended Schedule for Committee Stage Discussion of Budget, 2026 [Col. 2381]
Privilege: Remark Made by Hon. Sujeewa Senasinghe on 10.11.2025 [Col. 2382]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2383]

PUBLIC DEBT MANAGEMENT ACT:
Regulations [Col. 2393]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 28වන සිකුරාදා***
*2025 நவம்பர் 28, வெள்ளிக்கிழமை*
*Friday, 28th November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.00 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### 2026 අය වැය කාරක සභා අවස්ථා විවාදයේ සංශෝධිත වැඩසටහන
### 2026 வரவு செலவுத்திட்டக் குழுநிலை விவாதத்திற்கான திருத்திய நிகழ்ச்சிநிரல்
### AMENDED SCHEDULE FOR COMMITTEE STAGE DISCUSSION OF BUDGET, 2026

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, මේ වනවිට රට තුළ පවතින හදිසි ආපදා තත්ත්වය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව 2025 නොවැම්බර් 27 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් අද දින අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය නොපැවැත්වීමටත්, 2025 නොවැම්බර් 29, එනම් හෙට දින පාර්ලිමේන්තු රැස්වීම් නොපැවැත්වීමටත් තීරණය කරන ලද බවත්, ඒ අනුව 2026 අය වැය කාරක සභා අවස්ථාවේ වැඩසටහනෙහි,

- වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
- තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

යන අමාත්‍යාංශවල වැය ශීර්ෂ විවාදයට ගැනීමට නියමිතව තිබූ දින සංශෝධනය කර තිබෙන බවත් එකී සංශෝධිත දින පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමට කැමැත්තෙමි.

- 2025 නොවැම්බර් 29 සෙනසුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2025 දෙසැම්බර් 01 සඳුදා දින පූ.භා. 10.30 සිට අ.භා. 6.00 දක්වා ද (සම්මත කිරීම අ.භා 6.00 ට) බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ එදිනම අ.භා. 6.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා ද (සම්මත කිරීම මධ්‍යම රාත්‍රී 12.00 ට);

- වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2025 දෙසැම්බර් 02 අඟහරුවාදා පූ.භා. 10.30 සිට අ.භා. 6.00 දක්වා ද (සම්මත කිරීම අ.භා 6.00 ට) නොවැම්බර් 28 සිකුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අ.භා. 6.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා ද (සම්මත කිරීම මධ්‍යම රාත්‍රී 12.00 ට);

විවාදයට ගැනීමට නියමිත බව මෙම සභාවට දන්වා සිටිමි.

## II

### වරප්‍රසාද: 2025.11.10 දින ගරු සුජීව සේනසිංහ මහතා විසින් කරන ලද ප්‍රකාශය
### சிறப்புரிமை: 10.11.2025 அன்று மாண்புமிகு சுஜீவ சேனசிங்ஹவால் தெரிவிக்கப்பட்ட கூற்று
### PRIVILEGE: REMARK MADE BY HON. SUJEEWA SENASINGHE ON 10.11.2025

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය විසින් 2025 නොවැම්බර් 18 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 04 දිනැති අංක 2452/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාවේ අතුරු අනුව්‍යවස්ථාව සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 6 (ආ), (ඇ) සහ (ඒ), 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. මම පැහැදිලි කරන්නම්, මේ මොකක්ද කියලා. අපේ අලුත් Public Debt Management Act එක යටතේ, සියලු ණය ගැනීම් මහ බැංකුවෙන් සහ ERD එකෙන් වෙන් කරලා Public Debt Management Office එක යටතට ගෙනැල්ලා තිබෙනවා.

ඒ අනුව ප්‍රථමයෙන්ම, ඇමෙරිකානු ඩොලර්වලින් ඉදිරිපත් කරන Bond එකක් - ඩොලර් මිලියන 50කට - හෙට අනිද්දා open කරනවා. ඒකට අවශ්‍ය රෙගුලාසි සම්මත කිරීම තමයි මෙහිදී සිද්ධ වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, පෙත්සම් පිළිගැන්වීමේ අවස්ථාව.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු ධර්මප්‍රිය දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

2025 නොවැම්බර් 27වන දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා.

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, இஸ்மாயில் முத்து மொஹம்மட் ஆகிய நான், தற்போது வகித்துவரும் தேசியப் பட்டியல் பாராளுமன்ற உறுப்பினர் பதவியை 28.11.2025 ஆகிய இன்றிலிருந்து எனது சுயவிருப்பத்தின் பேரில் இராஜினாமா செய்து கொள்கின்றேன் என்பதை உத்தியோக பூர்வமாகத் தங்களுக்கு இங்கு அறியத் தருகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த இயற்கை அனர்த்தத்தினால் உறவுகளை இழந்து பாதிக்கப்பட்ட மக்களுக்கு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையிலே ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கிறேன். இந்தப் பாராளுமன்றத்தில் எனது குரலை ஒலிக்கவைக்க உதவிய அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியின் தலைவர் கௌரவ றிஸாட் பதியுதீன் அவர்களுக்கும் அக்கட்சியின் உயர்பீடத்துக்கும் ஆதரவாளர்களுக்கும் எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

நான் பதவி வகித்த காலத்திலே எனக்குத் துணைநின்ற மாண்புமிகு ஜனாதிபதி, கௌரவ பிரதமர், கௌரவ எதிர்க்கட்சித் தலைவர், சக பாராளுமன்ற உறுப்பினர்கள், விசேடமாக கௌரவ சபாநாயகர், பாராளுமன்றச் செயலாளர் நாயகம், பாராளுமன்றப் பணிக்குழுவினர் அனைவருக்கும் நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். எனக்கு வழங்கிய இந்தப் பதவியை இக்காலகட்டத்தில் உரிய முறையில் பயன்படுத்தி, கட்சியின் கட்டுப்பாடுகளுக்கும் முடிவுகளுக்கும் ஏற்ப கட்சிக்கும் தலைமைக்கும் துரோகம் இழைக்காமல் இன்றுடன் எனது பாராளுமன்றப் பதவியை இராஜினாமா செய்கின்றேன். நான் இதுவரைக்கும் இந்த மேலான சபையில் தங்கள்முன் சமர்ப்பித்த எம்மக்களின் தேவைகள் பற்றிய கோரிக்கைகளை நிறைவேற்றி அவர்களின் பிரச்சினைகளுக்குத் தீர்வுகளைப் பெற்றுத்தருமாறு வேண்டி நிற்கின்றேன். நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, රටේ වර්තමාන තත්ත්වය ගැන කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මේ ඇති වී තිබෙන සුළි කුණාටුව හා අධික වර්ෂාව හේතුවෙන් අපේ රටේ ජනතාව විශාල පිරිසක් ආපදාවට ලක් වෙලා සිටිනවා; මරණ

රැසක් සිදු වෙලා තිබෙනවා; අවතැන්වීම් සිදු වෙලා තිබෙනවා; නිවාස හානි, දේපළ හානි සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම, තවත් විශාල පිරිසක් මෙම ආපදාව හේතුවෙන් විවිධ තැන්වල කොටු වෙලා ඉන්නවා. එහෙම නම්, ආපදාවට ලක් වුණු රටේ ජනතාව සම්බන්ධයෙන් දැන් සිදු විය යුත්තේ, මේ ආපදා තත්ත්වයෙන්, එනම් ඒ අය දැන් පත් වෙලා සිටින අමාරු තත්ත්වයෙන් ඉක්මනින් මුදා ගන්නට අවශ්‍ය වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමයි. ඒ ජනතාව මුදා ගන්න අපි හැමෝම එකතු වෙන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළට අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.

මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, විශේෂයෙන්ම සෞඛ්‍ය අංශවලට, ආපදා කළමනාකරණ අංශවලට, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට -ඒ විවිධ අංශවලට- මේ වෙලාවේ වැදගත් වන්නේ ඉක්මනින්ම ප්‍රතිපාදන ටික යැවීම බව; ඒ වාගේම කොටු වුණු ජනතාව ඉන්න ස්ථානවලට බෝට්ටු ටික ලබා දීම බව. විශේෂයෙන්ම අපට ආරංචියි, ඒ බොහෝ තැන්වල ජනතාව අතරමං වෙලා ඉන්නවා කියලා. ඒ අය ඒ ඉන්න තත්ත්වයෙන් මුදා ගන්නට අවශ්‍ය බෝට්ටු ටික යවන්න ඕනෑ. ඒ වාගේම නාය යෑම්වලට ලක් වූ ජනතාවට විශේෂ සහන ටික ඉක්මනින්ම ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම අද දවසේ කළ යුතු වඩාත්ම වැදගත් දෙය මේකයි. මම විශේෂයෙන්ම ජනතාවගෙනුත් ඉල්ලා සිටිනවා, අවදානමට ලක් වුණු ප්‍රදේශවල ඉන්න ජනතාවට රාජ්‍ය නිලධාරින් උපදෙස් ලබා දුන්නාම ඒ උපදෙස් පිළිපදින්න කටයුතු කරන්න කියලා. මොකද, එතකොට තමයි ජනතාවගේ ජීවිත බේරා ගන්න පුළුවන්කම ලැබෙන්නේ.

මේ වන විට විදුලිය ඇනහිටීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා; නාය යෑම් විශාල ප්‍රමාණයක් තිබෙනවා; පස් කඳු කඩා ගෙන වැටිලා තිබෙනවා. ඉතින්, ඒ හැම දේටම අවශ්‍ය ප්‍රතිපාදන, අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර, ඩෝසර් යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර ආදිය සැපයිය යුතුයි. දැනටමත් අපේ නිලධාරින් කොට්ඨාසයක් -විශාල පිරිසක්- යම් වැඩ කොටසක් කරනවා. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක අංශය ඇතුළු සියලුදෙනා තවදුරටත් ශක්තිමත් කරමින් අපේ රටේ ජනතාවගේ ජන ජීවිත සුරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා අපෙනුත් වෙන්නට ඕනෑ යුතුකම් ටික අපි ඉෂ්ට සිද්ධ කරනවා.

මම තවත් එක ඉල්ලීමක් කරනවා, මුදල් ප්‍රතිපාදන ටික ඒ අදාළ ආයතනවලට යැවීමේදී මීට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ඉක්මනින්ම යැවීමට කටයුතු කරන්න කියලා. ඒ ඉල්ලීම ඉෂ්ට සිද්ධ වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු විපක්ෂ නායකතුමාට බොහොම ස්තුතියි, මේ අදහස් මතු කිරීම සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ව්‍යසන තත්ත්වය වැඩි වර්ධනය වීමේ සිට ගරු ජනාධිපතිතුමා මැදිහත් වුණා වාගේම අපි සියලු පක්ෂ නායකයනුත් එකතු කරගෙන සාකච්ඡා කරමින් තමයි කටයුතු කරගෙන යන්නේ. ඊයේ උදෑසන ගරු ජනාධිපතිතුමා කළ සාකච්ඡාවට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සම්බන්ධ වුණා. ඊයේ රාත්‍රියේදී ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමියත් සහභාගි වුණු ජාතික ආපදා සභාවට ගරු විපක්ෂ නායකතුමාත් සම්බන්ධ වුණා. මේ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ නියෝජනය කරන පක්ෂ නායකයන් සියලුදෙනා සමඟ ආරක්ෂක අමාත්‍යාංශ මූලස්ථානයේදී අද උදේ 10.00ට ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ කාරණය සම්බන්ධයෙන් යළිත් සාකච්ඡාවක් පැවැත්වෙනවා. ඊයේ දවසේ කරපු සාකච්ඡාවට විපක්ෂයේ සමහර පක්ෂ නායකයින්ට සම්බන්ධ වෙන්න බැරි වුණා. අපට අවශ්‍ය කරන්නේ මේ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ නායකයින් සහ පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් සම්බන්ධ කරගෙන අපේ රටේ ජනතාව මේ ආපදාවෙන් හැකි ඉක්මනින් බේරා ගන්නයි.

ගරු කථානායකතුමනි, ජීවිත ගලවා ගැනීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක වෙනවා; අනෙක් පැත්තෙන්, ජනතාවට සහන සැලසීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක වෙනවා; තවත් පැත්තකින්, ඒ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නඟා සිටුවීම සඳහා වෙච්ච වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. මම කියන්න කැමැතියි, මේ වන විට සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්ට අවශ්‍ය කරන මූල්‍ය ප්‍රතිපාදන යොමු කර තිබෙන බව. ඊයේ දවස වනකොට අපි ඒ සම්බන්ධ කටයුතු අවසන් කරලා තිබෙනවා. අවශ්‍ය තරම් මුදල් ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් අතට පත් වෙලායි තිබෙන්නේ. ඒ අය තවත් මුදල් ඉල්ලා සිටිනවා නම්, ඒ ප්‍රමාණයත් ලබා දෙන්න අපි සූදානම්.

දෙවැනි කාරණය මේකයි. මේ වන විට විශේෂයෙන්ම නාවික හමුදාව විසින් යාත්‍රා සූදානම් කරලා තිබෙනවා.

ඒකට අවශ්‍ය බෝට්ටු ඇතුළු යාත්‍රා හැම තැනකම සූදානම් කරලායි තිබෙන්නේ. ඒ යාත්‍රා ප්‍රමාණවත් නැත්නම් පෞද්ගලික අංශයෙන් අරගෙන හරි ඒ කටයුතු කරන්න මුදල් ලබාදෙන්න කියලා සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ ආපදා කළමනාකරණ නිලධාරින්ට රජය දැනුම් දීලා තිබෙනවා.

තුන්වැනි කාරණය මේකයි. ලංකා විදුලිබල මණ්ඩලය ගැන එතුමා කියපු කාරණය ඇත්ත. විදුලිය බිඳ වැටීම් වාර්තා වෙනවා. විදුලිබල මණ්ඩලය සැහෙන්න මහන්සියක් අරගෙන, සමහර තැන්වල ජීවිත අවදානමකුත් අරගෙන ඒවාට මැදිහත් වෙමින් ඉන්න බව කියන්න පුළුවන්. බොහෝ තැන්වල දැනටමත් ඒ කටයුතු නිරාකරණය කරලායි පවතින්නේ. අද පාර්ලිමේන්තුවේ කටයුතුත් ඉතා ඉක්මනට අවසන් කරන්නේ අද, හෙට, අනිද්දා සියලු මහජන නියෝජිතයන්ට තමන්ගේ ප්‍රදේශවලට ගිහිල්ලා ඒ සහන කටයුතුවලට උදවු කරන්නයි. ඔබතුමන්ලාට රාජ්‍ය යාන්ත්‍රණයක් එක්ක එකතු වෙලා, ඒ ඒ දේශපාලන අධිකාරියේ හැටියට ඒවාට මැදිහත් වෙන්න පුළුවන්කමක් තිබෙනවා. මෙතැනදී පුළුවන් උපරිම ජීවිත ප්‍රමාණයක් බේරා ගැනීම තමයි අපේ පරමාර්ථය බවට පත් වෙන්න ඕනෑ. ඒ වාගේම, අවතැන් වෙලා, කොටු වෙලා නැත්නම් මොනවා හරි ආබාධයකට ලක් වෙලා ඉන්න සියලු ජනතාවට ඉක්මන් සහන සලසන්න ඕනෑ. යළි යළිත් කියා සිටින්නේ අපි පාර්ලිමේන්තුවක් හැටියට ඒ වෙනුවෙන් එකට එකතු වෙලා වැඩ කරන්නට ඕනෑ, රටක් හැටියට මේ ව්‍යසනයට මුහුණ දීලා අපි ශක්තිමත්ව ගොඩ එන්නට ඕනෑ කියලායි. ඒ වෙනුවෙන් ඔබතුමන්ලා ලබා දෙන සහයෝගයට අපි ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මේ වෙලාවේ අපේ රටේ ඉතා අවාසනාවන්ත තත්ත්වයක් තිබෙන්නේ. මම දිග කථාවක් කරන්න නොවෙයි බලාපොරොත්තු වන්නේ. මේ වෙනකොට ඇති වෙලා තිබෙන මේ අවාසනාවන්ත තත්ත්වය තුළ හදිසි නීතිය පනවලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාව අනුව කටයුතු කළොත් තමයි ත්‍රිවිධ හමුදාවට, පොලීසියට, දිස්ත්‍රික් ලේකම්වරුන්ට මේ වැඩ කටයුතු නීත්‍යානුකූලව කරන්න අවස්ථාව ලැබෙන්නේ, අත්‍යවශ්‍ය සේවා ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලැබෙන්නේ.

ඊයේ විපක්ෂ නායකතුමාත් මේ කාරණය මතක් කළා. දැන් පැය 24ක් ගියත් ජනාධිපතිතුමා තවම හදිසි නීති තත්ත්වයක් ප්‍රකාශයට පත් කරලා නැහැ. ඒක නිසා කරුණාකරලා මේ ඇති වෙලා තිබෙන අවාසනාවන්ත තත්ත්වයේදී ජනතාවට සහන ලබා දීමට නම් හදිසි නීති තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, එය ගරු ජනාධිපතිතුමාට කළ හැකි කාරණයක්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි කාලය කළමනාකරණය කරන්න ඕනෑ. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන්මයි මටත් කියන්න තිබෙන්නේ. ඊයේ සවස 4.00ට අපි කිව්වා වාගේ මේකේ බැරෑරුම්කම සලකා බලා මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න පුළුවන්, හදිසි නීතිය ප්‍රකාශයට පත් කළොත්. එහෙම කළොත් ආපදාවලට ලක්වුවන්ට අවශ්‍ය දේවල් බෙදන්න පුළුවන්. එහෙම නැති වුණොත් රජයේ නිලධාරීන් මුදල් වියදම් කිරීමට භය වෙනවා. ඒ වාගේම මම ඔබතුමාගේ අවධානය මේ කාරණයට යොමු කරනවා. 2010 නොවැම්බර් මාසයේ 11, 12 මේ පාර්ලිමේන්තුවත් ජලයෙන් යට වුණා. දැන් අපි එනකොටත් දියවන්නා ඔයේ water level එකත් වැඩි වෙලා තිබෙනවා. කරුණාකරලා water level එක අඩු කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මම විශේෂ ඉල්ලීමක් කරන්නේ. ප්‍රාදේශීය සභාවලින් මේ වෙලාවේ ලොකු වැඩ කොටසක් කරන්න පුළුවන්. ගරු ආණ්ඩුකාරතුමන්ලාගේ සම්බන්ධීකරණය යටතේ කොමසාරිස්ලා එක්ක ප්‍රාදේශීය සභා සභාපතිවරු වාඩි කරලා ඉතා ඉක්මනින් මුදල් අනුමත කර ගන්න වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න කියලා විශේෂයෙන් ඉල්ලනවා. එහෙම නොවුණොත්, ඒ ප්‍රමාදය නිසා කාණු කපලා, අගල් කපලා, ඇළදොළවල් සුද්ද කරලා වතුරට යට වෙලා තිබෙන ප්‍රමාණය බේරාගන්න තිබෙන අවස්ථා ටික නැති වෙනවා. ඒක නිසා ඒකට අවස්ථාව දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මම මේ කථා කරන්නේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට. අපි අද උදේත් හොයලා බැලුවා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ මුදල් තිබෙනවා. ඒ සඳහා allocations තිබෙනවා, provisions තිබෙනවා. ආපදාවලට Recurrent Expenditureවලින් රුපියල් මිලියන 850යි වෙන් කරලා තිබුණේ.

රුපියල් බිලියන 1.5යි වෙන් කරලා තිබුණේ, Capital Expenditure වශයෙන්. හැබැයි, තව රුපියල් බිලියන 15ක් විතර වියදම් කරන්න පුළුවන් මේ සති කිහිපයේ. ඉතින්, ඒවා අවශ්‍ය මුදල්. ඒකට අලුතින් පාර්ලිමේන්තුවේ අනුමැතියක් හෝ මොකක්වත් අවශ්‍ය නැහැ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ 2026ට provision දෙන්න ඕනෑ වීමයි. 2026 provisionවලට අඩුම ගණනේ රුපියල් බිලියන 15ක්වත් වහාම වෙන් කරන්න ඕනෑ. මොකද, ඇළ දොළවල් හදන්න Capital Expenditureවලට ඒ අවශ්‍ය මුදල් වෙන් කරන්න ඕනෑ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මේ ආණ්ඩුව දරන උත්සාහයට අපි ඇත්තටම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මට

විශේෂ කාරණයක් කියන්න තිබෙනවා, ගරු කථානායකතුමනි. උතුරු සහ නැඟෙනහිර පළාත් ගත්තාම, මේ වෙනකොට කඳුකරයේ පවතින වැසි තත්ත්වයෙන් එන ජලය උතුරු සහ නැඟෙනහිර ප්‍රදේශවලින්, විශේෂයෙන් මඩකලපුව සහ අම්පාර වාගේ ප්‍රදේශවලින් තමයි මුහුදට යන්නේ. එතකොට අපට ආපදා තත්ත්වයක් ඇති වන්නේ අද නොවෙයි. හෙට, අනිද්දා වාගේ දවස්වල තමයි අපට ආපදාව එන්නේ. මෙතැන විශේෂ ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. රජයෙන් මුදල් වෙන් කරලා දිස්ත්‍රික්කවලට යවලා තිබෙනවා ආපදා තත්ත්වයක් ආවොත් camps හදාගෙන ඒවායේ ඉන්න කට්ටියට වියදම් කරන්න. හැබැයි, හොරකම් වැනි සිදුවීම් නිසා ගෙවල් දාලා යන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ ප්‍රදේශවල ඉන්න ජනතාව evacuate වෙන්න කැමැති නැහැ. මොකද, ඒගොල්ලන් කියනවා evacuate කළොත් ඔවුන්ගේ දේපළ හොරකම් කරනවා කියලා. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. නීතිමය පැත්තෙන් කොහොමද මේක විසඳාගන්න පුළුවන් කියලා ඉතා ඕනෑකමින් බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, campsවලට ගියේ නැත්නම් හදිසි අවස්ථාවක් ආවාම එකවර ගිහින් ඒගොල්ලන් බේරාගන්නත් බැහැ. ගෙදර දාලා camp එකට යන්න කිව්වාම ඒ මිනිස්සු යන්න කැමැතිත් නැහැ. මොකද, ගෙවල්වල හොරකම් සිදුවෙයි කියලා. එතැන ඉන්න ජනතාවට මොනවා හෝ සහනයක් දෙන්නත් නෛතික පසුබිමක් නැහැ කියලා ප්‍රාදේශීය ලේකම්වරු කියනවා. ඒත් එක්කම මම කාරුණික ඉල්ලීමක් කරනවා, දිස්ත්‍රික්කවලට දිස්ත්‍රික් ලේකම්වරු පත් කරනකොට පොඩ්ඩක් අත්දැකීම් තිබෙන අය පත් කරන්න කියලා. මඩකලපුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්ට ජාතික ජන බලවේගයේ හිතවතෙක් කියන එක හැර වෙන අත්දැකීමක් නැහැ. අපි කියන කිසි දෙයක් එතුමා අහන්නේ නැහැ. ඒ ගැනත් පොඩ්ඩක් බලන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. මම හිතන විධියට විපක්ෂයට දැන් සෑහෙන්න අවස්ථාව ලබා දුන්නා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි මේක -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, හදිසි තත්ත්වයක් තිබෙනවා. අනුරාධපුර පුත්තලම පාරේ කලාවැව පාලම උඩ මීටර් 70ක් සමහ බස් රථයක් නතර වෙලා තිබෙනවා, දැන් පැය එකහමාරක් තිස්සේ. හෙලිකොප්ටරයක සහාය ලබාගන්න තවම අනුමැතිය ලැබී නැහැ. බරපතළ තත්ත්වයක් තිබෙනවා. ඒ පිළිබඳව රජයේ අවධානය යොමු කරවනවා. රජය ක්ෂණිකව මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා. පැය එකහමාරක් තිස්සේ ඒ පාලම උඩ මීටර් 70ක් පමණ සිටින බස් රථයක් නැවතිලා තිබෙනවා. මට දැන් දිගින් දිගටම විශ්වාසවන්ත දුරකතන ඇමතුම් කිහිපයක්ම ආවා.

ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ රතු තත්ත්වයක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. රත්නපුර ප්‍රදේශයට ඊයේ අධික වර්ෂාවක් ලැබුණා. ඒ නිසා කළුතර දිස්ත්‍රික්කයේ සහන සැපයීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා. මොකද, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවකම දිගින් දිගටම වතුර රැඳිලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඉක්මනින් ප්‍රතිචාර දක්වන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
கௌரவ சபாநாயகர் அவர்களே, குறிப்பாக 2-3 நாட்களாக நிலவும் அதிக மழை மற்றும் காற்றின் காரணமாக மட்டக்களப்பு, திருகோணமலை, அம்பாறை ஆகிய மாவட்டங்கள் - கிழக்கு மாகாணம் முழுவதும் - மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. இது தொடர்பில் நேற்று மாண்புமிகு ஜனாதிபதி அவர்கள் எடுத்திருந்த உடனடியான முயற்சிகளை நாங்கள் பாராட்டுகின்றோம். நேற்று முன்தினம் வீசிய சூறாவளியினால் ஆயிரக்கணக்கான வீடுகளின் கூரைகள் முற்றுமுழுதாக உடைந்து அந்த மக்கள் போவதற்கு இடமில்லாமல் அலைந்து திரிகின்றார்கள். வீடுகளை இழந்த சிலர் உறவினர்களின் இல்லங்களிலே தங்கியிருக்கின்றார்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up, Sir.

ஆகவே, உடனடியாக அவர்களுக்கான வசதிகளை ஏற்படுத்திக் கொடுக்கும்படி கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කළ, ඒ අනුරාධපුරයේ සිද්ධිය නිවැරදියි. Senior DIG ඒ බස් එකට දැනුම් දීලාත් තිබුණා, ඒ වෙලාවේ යන්න එපා කියලා. දැන් ඒක හිර වෙලා තිබෙනවා. ඒ බස් එකේ 70ක් පමණ දෙනා ඉන්නවා කියලා තමයි කියන්නේ. මේ වෙනකොට එතැන හමුදා කාණ්ඩ දෙකක් ක්‍රියාත්මක වෙනවා. ඊට අමතරව තව සුළු මොහොතකින් choppers කැඳවා ගන්නා බව වසන්ත සමරසිංහ අමාත්‍යතුමා කිව්වා. ඒ අනුව වැඩේ සිද්ධ වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් මම සියලුදෙනාටම අවස්ථාව දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

අපි මේක ඉවර කරලා යමු. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සියලු මන්ත්‍රීවරුන්ට මම අවස්ථාව ලබා දුන්නා. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමාගෙන් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, වැදගත් යෝජනාවක් මම මේ කරන්නේ. මේ ආපදාවට අවශ්‍ය අමතර මුදල් ලබා ගැනීමක් සිදු කරන්නට රජය යෝජනාවක් ගෙනෙනවා නම්, අපට සහාය දෙන්න පුළුවන්. ඊළඟට පාර්ලිමේන්තුව රැස් වන සඳුදා දිනයේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා නම්, මේ ව්‍යසන තත්ත්වයට ලක් වූ ජනතාවට සහන ලබාදීම සඳහා අවශ්‍ය අරමුදල් ලබා ගැනීම වෙනුවෙන් ඒකට සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න අපට පුළුවන්. ඒ වාගේම මම නැවත නැවතත් අපේ ගරු අමාත්‍යතුමාට කියන්න කැමැතියි, මුදල් වෙන් කිරීම වාගේම ඒ මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට, ආපදාවට අදාළ සියලු ආයතනවලට යැවීම ඉතාම වැදගත්. මොකද, මුදල් වෙන් කිරීම පමණක් නොවෙයි. වෙන් කරන මුදල්වලින් ආපදාවලට ලක් වුණු ජනතාවට සහන ලබාදීම තමයි ඉතාම වැදගත් වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා, ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩ කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2025 නොවැම්බර් 13 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට පූ.භා. 9.30 දක්වා විය යුතු ය. පූ.භා. 9.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල සහ 2025 නොවැම්බර් 13 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා වෙන් කළ 2025 දෙසැම්බර් 01 සඳුදා සහ 02 අඟහරුවාදා දිනවල පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට මධ්‍යම රාත්‍රි 12.00 දක්වා ද විය යුතු ය. මධ්‍යම රාත්‍රි 12.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. මධ්‍යම රාත්‍රි 12.00 ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින විසිර යෑමේ දී මෙම පාර්ලිමේන්තුව 2025 දෙසැම්බර් 01 සඳුදා පූ.භා. 9.00 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ නියෝග විවාදයකින් තොරව අනුමත කිරීමට, කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මැතිතුමා.

## රාජ්‍ය ණය කළමනාකරණ පනත: නියෝග
## பொதுத் தனிசு முகாமைத்துவச் சட்டம்: ஒழுங்குவிதிகள்
## PUBLIC DEBT MANAGEMENT ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාවේ අතුරු අනුව්‍යවස්ථාව සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 6(ආ), (ඇ) සහ (ඒ), 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2025 ඔක්තෝබර් 24 දිනැති අංක 2459/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව පූ.භා. 9.24ට, අද දින සභා සම්මතිය අනුව, 2025 දෙසැම්බර් 01වන සඳුදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி மு.ப. 9.24 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2025 டிசம்பர் 01, திங்கட்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 9.24 a.m. until 9.00 a.m. on Monday, 01st December,2025, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.